# සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය

# තනතුරු ඇබෑර්තු

සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතියේ පුරප්පාඩුව් ඇති සාමාන්‍යාධිකාරී තනතුර සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන ලද කොළඹ දිස්ත්‍රික්කය තුළ වසර 02 ක ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගෙන් 2026./10/19 දින සිට 2026/11/02 දින දක්වා බාහිරින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තනතුර ස්ථිරය. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලේ දයකත්වය හිමිය.

| තනතුර | වැ.ප.අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | SM - 01 -2025 (පැරණි 101:03) | 01 | 23454 - 39654 / 450 X 10 - 520 X 10 - 650 X10 (සංශෝධනය වෙමින් පවතී.) |

**කොමිෂන් සභා අනුමත දීමනා -:**

බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති දීමනා සහ වරින් වර නිකුත් කරන චක්‍රලේඛ, උපදෙස් ප්‍රකාර නියම කරනු ලබන දීමනා ගෙවනු ලැබේ.

03. බඳවා ගැනීමේ සුදුසුකම්.

**1. සාමාන්‍යාධිකාරී - SM - 01 -2025 (පැරණි 101:03)**

(අ) SM - 01 - 2025 (පැරණි 101:03) මට්ටමේ සාමාන්‍යාධිකාරී ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක වසර දෙක (02) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් හෝ MG - 03 - 2025 (පැරණි 102:04) ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ MG - 02 - 2025 (පැරණි 102:05) ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක වසර අට (08) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ආ) ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමඟ MG - 02 - 2025 (පැරණි 102:05) ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ඇ) රජය පිළිගත් ආයතනයක ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුද්දකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක / කළමනාකරණ මට්ටමේ වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යා/වාණිජ්‍ය විෂය ධාරාවේ උපාධියක් හෝ කළමනාකරණය පිළිබඳ NVQ - 07 මට්ටමේ සහතිකය හෝ සමග පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර තුන (03) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

04. වයස් සීමාව - අවු.30 - 50

05. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

06. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර බඳවා ගැනීමේ නීති රීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත හෝ ලබා දී ඇති පත්වීම අවලංගු කළ හැකිය.

07. වෙනත් සමුපකාර සමිතියක සේවයේ නියුතු ස්ථිර සේවකයෙකු අයදුම්පත් යොමු කරන්නේ නම් තම අයදුම්පත අයදුම්කරු දැනට සේවය කරන සමිතියේ ආයතන ප්‍රධානී මගින් එවිය යුතු වේ. වෙනත් සමිතියක සේවකයෙකු සෘජුවම ඉදිරිපත් කර ඇති අයදුම්පත් කිසිම හේතුවක් නිසාවත් සලකා බලනු නොලැබේ.

08. අයදුම්පත්‍රය යොමු කිරීම.

I. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " **සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම** " යන්න සඳහන් කළ යුතුය.

II. ඔබ විසින් සකසන ලද අයදුම්පත්‍රය 2026/11/02 වැනි දින ප.ව.3.00ට පෙර හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (අතින් ගෙනවිත් භාරදීමට හා විද්‍යුත් තැපැලට යොමු කිරීමටද හැකියාව ඇත.) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

**සභාපති.**
**සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය,**
**562, ගාලු පාර, කොළඹ 3.**
**careerscolombosouth@gmail.com**
**0112502316**

**සභාපති**

**2026/10/19 දින දීය.**
**සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය.**

Gazette.lk